ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (ස්වභාවික විද්‍යා)උපාධි වැඩසටහන-පස්වන මට්ටම 2017/2018

අවසාන පරීක්ෂණය - 2018

අධ්‍යාපන මනෝ විද්‍යාව - ESU3211

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2018.01.29 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. අධ්‍යාපන මනෝවිද්‍යාව ගුරුවරයාගේ පෞරුෂය සංවර්ධනය කිරීමට උපකාරී වන්නේ කෙසේදැයි කරුණු තුනක් (03) දක්වමින් පැහැදිලි කරන්න.

02. නවයෞවනයන් තුළ දක්නට ලැබෙන ආත්ම කේන්ද්‍රීය චින්තනයෙහි ලක්ෂණ තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

03. ළමා චර්යා අධ්‍යයන ක්‍රමයක් ලෙස සම්මුඛ සාකච්ඡාවල ඇති ප්‍රබලතාව සුදුසු උදාහරණ දෙකක් (02) දක්වමින් පැහැදිලි කරන්න.

04. "ඇතැම්විට ගුරුවරයාගේ චර්යාවන් ළමයින් තුළ අහිතකර චිත්තවේග ඇති කරලීමට හේතු විය හැක." උදාහරණ තුනක් (03) දක්වමින් ඉහත ප්‍රකාශය සාධාරණීකරණය කරන්න.

05. ළමයෙකුගේ වර්ධනය හා සංවර්ධනය අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

06. (i) ළමයින්ගේ පූර්ව ක්‍රියාකාරී චින්තන අවධියේ ලක්ෂණ තුනක් (03) ලියා දක්වන්න.

    (ii) ඉහත අවධියෙහි පසුවන ළමුන් සමඟ කටයුතු කිරීමේ දී ගුරුවරයෙකු අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග තුනක් (03) විස්තර කරන්න.

07. ඉගෙනුම පිළිබඳ න්‍යායාත්මක පැහැදිලි කිරීම් අධ්‍යයනය කිරීම මඟින් ගුරුවරයෙකුට ලබාගත හැකි වාසි **තුනක් (03)** කෙටියෙන් විස්තර කරන්න.

08. ඉගෙනුමට අදාළව ' සූදානම' යන සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) ප්‍රජානන සංවර්ධනයට අදාළව විගොට්ස්කිගේ න්‍යායයේ ප්‍රධාන මූලධර්ම පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) විගොට්ස්කිගේ න්‍යායය සහ පියාජේගේ සංවර්ධන න්‍යායය අතර ඇති මූලික වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) විගොට්ස්කිගේ න්‍යායයේ ප්‍රධාන මූලධර්මවලට අදාළව ළමයින්ගේ ප්‍රජානන සංවර්ධනයේ දී ගුරුවරයාගේ භූමිකාව උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

10. (i) සුදුසු උදාහරණ මඟින් 'පෞරුෂය' යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) ළමයින්ගේ පෞරුෂ සංවර්ධනයට බලපාන සාධක සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(iii) ප්‍රාථමික ළමුන්ගේ පෞරුෂ සංවර්ධනය කිරීමට ගුරුවරයෙකුට භාවිතා කළ හැකි උපායමාර්ග **හතරක් (04)** සාකච්ඡා කරන්න. (ලකුණු 08)

11. (i) බෲනර්ගේ අනාවරණ ඉගෙනුම් න්‍යායයට අනුව පුද්ගලයෙකු දැනුම ලබා ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) පන්තිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ අනාවරණ ඉගෙනුම ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරයාගේ භූමිකාව සුදුසු උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) අනාවරණ ඉගෙනුම තුළදී සිසුන්ව පෙළඹවීම සඳහා ගුරුවරයෙකුට යොදාගත හැකි ක්‍රියාමාර්ග **හතරක් (04)** විස්තර කරන්න. (ලකුණු 08)

12. (i) පුද්ගලයෙකු යම් කාර්යයක් කෙරෙහි පෙළඹෙන්නේ කෙසේදැයි පෙළඹවීම සඳහා වූ ප්‍රජානන ප්‍රවේශයට අදාළව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) සිසුන් තුළ ස්වයං පෙළඹීම සංවර්ධනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) සිසුන් තුළ ස්වයං පෙළඹීම සංවර්ධනය කිරීමට ගුරුවරයෙකුට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග හතරක් **(04)** විස්තර කරන්න. (ලකුණු 08)

13. (i) 'පරිණතිය' යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) සුදුසු උදාහරණ තුනක් **(03)** දක්වමින් ඉගෙනුම සඳහා පරිණතියේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ළමයින්ගේ බුද්ධිය සාධක දෙකක් අතර ඇතිවන අන්තර් ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයකි.

(අ) කුඩා ළමුන්ගේ බුද්ධිමය හැකියා සංවර්ධනය කෙරෙහි බලපාන සාධක දෙකක් **(02)** නම් කරන්න. (ලකුණු 02)

(ආ) කුඩා ළමුන් තුළ බුද්ධිමය හැකියා සංවර්ධනය කිරීමේ දි ඉහත සාධකවල බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 08)

14. (i) පුද්ගලයෙකුගේ ජීවිතයේ නවයෞවන අවධිය යන්න නිර්වචනය කරන්න. (ලකුණු 05)

(ii) නවයෞවනයන්ගේ ප්‍රජානන සංවර්ධනයේ ලක්ෂණ තුනක් **(03)** එක් ලක්ෂණයක් සඳහා එක් උදාහරණයක් බැගින් සඳහන් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 09)

(iii) නවයෞවනයන්ගේ ප්‍රජානන සංවර්ධනය සුසාධ්‍යකරණය කිරීමට ගුරුවරයෙකුට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් **(03)** සාකච්ඡා කරන්න. (ලකුණු 06)

හිමිකම් ඇවිරිණි.

00020

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**FACULTY OF EDUCATION**

**BACHELOR OF EDUCATION (NATURAL SCIENCE)**

**DEGREE PROGRAMME**

**LEVEL - 05**

**FINAL EXAMINATION 2018**

**ESU3211 – EDUCATIONAL PSYCHOLOGY**

**DURATION – THREE (03) HOURS**

Date: 29.01.2018 Time: 9.30 a.m. – 12.30 p.m.

**Answer All Questions in Part I and any three (03) questions from Part II.**

## PART - I

01. Explain how the Educational Psychology helps to develop teachers' personality by citing **three (03)** points.

02. Describe briefly **three (03)** characteristics of 'ego centric' thinking visible among adolescents.

03. Explain the strengths of interviews as a child study method by citing **two (02)** suitable examples.

04. Sometimes "Teachers behavior may cause the arousal of unwholesome emotions in children" Justify this statement by citing **three (03)** examples.

05. Explain briefly the difference between the 'Growth' and the 'Development' of a child.

06. i. Write down **three (03)** characteristics of children at pre-operational stage.

    ii. Explain **three (03)** strategies that should be followed by teacher when work with children at this stage.

07. Explain briefly **three (03)** benefits that a teacher can gain by studying the theoretical explanations of learning.

08. Explain the concept 'readiness' with related to learning.

(Marks 5 x 8 = 40)

## PART - II

09. i. Explain the basic principles of the Vygotsky's theory of Cognitive Development.

(06 marks)

ii. Explain the basic differences between the Vygotsky's theory and the Piaget's developmental theory.

(06 marks)

iii. Citing examples examine the role of the teacher in cognitive development of children with respect to the basic principles of Vygotsky's theory.

(08 marks)

10. i. Explain the concept 'personality' by using suitable definitions.

(06 marks)

ii. Discuss the factors affecting personality development of children.

(06 marks)

iii. Discuss about **four (04)** strategies that can be used by a teacher to develop personality of primary level students.

(08 marks)

11. i. Explain how an individual obtains knowledge according to Bruner's 'Discovery learning theory'

(05 marks)

ii. Explain the teacher's role in implementing discovery learning to classroom teaching-learning process with suitable examples.

(07 marks)

iii. Describe **four (04)** strategies that can be used by a teacher to motivate students during discovery learning.

(08 marks)

12. i. Explain how an individual motivates towards a task with respect to the cognitive approach of motivation.

(06 marks)

ii. Explain the importance of developing self motivation within the students.

(06 marks)

iii. Describe **four (04)** strategies that can be followed by a teacher to develop self motivation within students.

(8 marks)

13. i. Define the concept 'Maturation'

(04 marks)

ii. Citing **three (03)** suitable examples explain the importance of maturation in learning.

(06 marks)

iii. Child's intelligence is the product of interaction between two factors.

a. Name the two factors that affect the development of intellectual abilities of young children.

(02 marks)

b. Explain the effect of these factors in developing intellectual abilities of young children.

(08 marks)

14. i. Define the 'adolescence stage' of an individual's life.

(05 marks)

ii. Explain **three (03)** characteristics of the cognitive development of adolescents by citing one example for each.

(09 marks)

iii. Discuss **three (03)** strategies that can be followed by a teacher to facilitate the cognitive development of adolescents.

(06 marks)

*-Copyrights reserved-*